www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වොෂින්ටනය යුද්ධයට කඩතුරාවක් ලෙස සිරියානු රසායනික අවි පිලිබඳ ප්‍රචාරය යලි පන ගන්වයි

Washington revives Syria chemical weapons propaganda as pretext for war

**2019 මැයි 23**

ජනාධිපති බෂාර් අල් අසාද්ගේ ආන්ඩුව රසායනික ආයුධ භාවිතා කලේය යන කියාපෑම මත වොෂින්ටනය සිරියාවට එරෙහිව මිලිටරි ප්‍රහාරයක් සඳහා යලි වතාවක් තර්ජනය කරමින් සිටියි.

මෙම ප්‍රහාරය ක්‍රියාත්මක කරනු ලැබුවහොත්, එය, රසායනික අවි භාවිතය පිලිබඳ තහවුරු නොකරන ලද චෝදනා කඩතුරාවක් ලෙස යොදා ගනිමින් යුද්ධයෙන් විනාශ වූ රට තුලට 2017 අප්‍රේල් සහ 2018 අප්‍රේල් වලදී මිසයිල වැසිවැස්ස වූ ට්‍රම්ප් පාලනාධිකාරය විසින් එල්ල කරන තෙවන ප්‍රහාරය වනු ඇත.

නවතම තර්ජනය නිකුත් කෙරුනේ මෑතකදී රාජ්‍ය දෙපාර්තමේන්තුවට පත් කෙරුනු ප්‍රකාශිකාව වන මෝර්ගන් ඔර්ටාගස්ගේ, ප්‍රකාශයක් ආකාරයෙනි. තම පූර්වගාමියා මෙන්ම ඇය ද පත් කරනු ලැබුවේ දක්ෂිනාංශික ෆොක්ස් නිව්ස් ටීකාකරුවන්ගේ ඉස්තාලයෙනි. "අසාද් ආන්ඩුව රසායනික අවි භාවිතා කරන්නේ නම් එක්සත් ජනපදයත් අපගේ සගයනුත් වහාම උචිත පරිදි ප්‍රතිචාර දක්වනු ඇති බවට අප යලියලිත් අනතුරු අඟවන්නෙමු" යැයි ප්‍රකාශය පවසයි.

අල්කයිඩාවට අනුබද්ධ සිරියානු සංවිධානය වන අල් නුස්රා පෙරමුනේ නවතම මූර්තිය වන හයාට් ටහ්රීර් අල් ෂාම් මිලීෂියාව අධිකාරය දරන වයඹදිග සිරියාවේ ඉඩ්ලිබ් ප්‍රාන්තය තුල මෑතම සිද්ධිය සිදු වූ බවට චෝදනා එල්ල වී ඇත.  සිරියානු හමුදා සහ රුසියානු ගුවන් බලය මගින් පිටුබලය ලත් මිත්‍ර මිලීෂියාවන් විසින් මෑත සති වලදී ඉස්ලාමීය සන්නද්ධ බලයන්ට එරෙහිව සටනක් දියත් කොට ඇත.

මෙම ප්‍රාන්තය තුල ඩමස්කස් ආන්ඩුවේ පාලනය යලි තහවුරු කරනු ලැබුවහොත්, එමගින්, එක්සත් ජනපදයේ එහි නේටෝ සහ කලාපීය සගයන්ගේ, විශේෂයෙන්ම සව්දි අරාබියේ සහ ඊස්රායලයේ, පිටුබලය සහිතව, වසර අටකට ආසන්න කාලයක් පුරා තන්ත්‍ර මාරුවක් සඳහා ගෙනයන යුද්ධය අවසන් වූ බව සංඥා කරනු ඇතැයි වොෂින්ටනය උත්සුකය වෙයි. සිය දහස් ගනන් ජීවිත බිලිගත් මෙම යුද්ධය මිලියන ගනනක් සරනාගතයින් බිහි කර ඇත.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගෙනයන බව පවසමින් ද, "ඉරාකය සහ සිරියාව තුල ඉස්ලාමීය රාජ්‍යය (අයිඑස්අයිඑස්)" ට එරෙහිව සටන් කිරීමේ කඩතුරාව යටතේ 2,000 ක හමුදා සේනාංකයක් පිටත් කර හරිමින් සහ විනාශකාරී ගුවන් ප්‍රහාර සිදු කරමින් ද, එජය 2014 දී සිරියාව තුල ඍජු හමුදා මැදිහත්වීම ආරම්භ කලේ ය. එය දැන් සිරියාව තුල අවසාන අල් කයිඩා ඉතුරුපහදු බේරා ගැනීමේ අරමුනින් ප්‍රහාර දියත් කිරීමට අනතුරු අඟවමින් සිටියි.

සිවිල් ජනයාගේ ජීවිත විනාශයන් පිලිබඳව වොෂින්ටනය කනස්සල්ලට පත් වී ඇතැයි යන කඩතුරාව බැලූ බැල්මටම විකාරරූපීය. මිනිසුන් කාන්තාවන් සහ ලමුන් දහස් ගනන් ඝාතනය කරමින් සිරියාවේ රැකා නගරය එජ යුද ප්‍රහාරක යානා සහ හෝවිට්සර් මිසයිල විසින් පොලොවට සමතලා කල විට මෙවැනි මනස්තාපයන් ප්‍රදර්ශනය නොකෙරින. වරක් ඉරාකයේ දෙවෙනි විශාලතම නගරය වූ මොසුල් නගරය මේ ආකාරයටම එජය විසින් වටලනු ලැබ යටත් කෙරුනු අවස්ථාවේ මීටත් වඩා අධික වූ සිවිල් ජන ජීවිත විනාශයන් ගැන වචනයක් හෝ සඳහන් නොකෙරිනි.

සිරියාව තුල අලුත් වූ තර්ජනය මතු ව එන්නේ ඩමස්කසයේ ප්‍රධාන සගයා වන ඉරානයට එරෙහිව පර්සියානු බොක්කේ දැවැන්ත එජ මිලිටරි වර්ධනයේ සන්දර්භය තුලයි. ඉරාන වෙරලට ඔබ්බෙන් මුහුදු කලාපයට පෙන්ටගනය ගුවන්යානා ගෙනයන නෞකාවලින් යුත් යුද හමුදා කන්ඩායමක් පිටත් කර යවා ඇත. එජ නාවික හටයින් සමූහයක් සහ පේට්‍රියට් මිසයිල සේනාංකයක් රැගෙන යන දිය ගොඩ දෙකෙන්ම පහර දිය හැකි යුද නෞකාවක් සමග, න්‍යෂ්ටික ශක්‍යතාවක් සහිත බී-52 ගුවන් ප්‍රහාරක යානා ඇතුලු, බෝම්බ ප්‍රහාරක බල ඇනියක් ඉහත කන්ඩායමට සම්බන්ධ කර ඇත.

ඍජු ආක්‍රමනයක් පිලිබඳව නොසැඟවූ තර්ජනයක් තුල කලාපයට හමුදා හටයින් 120,000 ක් තරම් ඉහල සංඛ්‍යාවක් යැවීමට පෙන්ටගනය සැලසුම් කර ඇත. 2003 දී ඉරාක ආක්‍රමනය සූදානම් කිරීමේදී මෙම

ප්‍රමානයට සමාන කාර්ය සාධක බල සේනාංකයක් බලමුලු ගැන්වින.

එජ අධිරාජ්‍යවාදය මැද පෙරදිගට නැවත වතාවක් ගෙනැවිත් ඇත්තේ සැබෑ හෝ ගොතන ලද නිමිත්තක් සොයා ගනිමින් ආරම්භ කෙරෙන යුද්ධයකි.

බැග්ඩෑඩයේ එජ තානාපති කාර්යාලයේ සිට සැතපුම් තුනෙන් එකක් පමන දුරින් පිහිටි අතිශයින්ම තර කෙරුනු රැකවල් සහිත හරිත කලාපය තුලට පතිත වූ ආගන්තුක රොකට්ටුව පිටුපස ඉරානයේ පිටුබලය ලබන ඉරාක මිලීෂියාවක් සිටින බවට නැගුනු චෝදනාව සමගම එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙරලට ඔබ්බෙන් පිහිටි මුහුදේ දී තෙල් ප්‍රවාහන නෞකාවකට එරෙහි කඩකප්පල්කාරී ක්‍රියා සම්බන්ධයෙන් ඉරානය වගකිව යුතුය යන චෝදනාව ද පැමිනුනි.

අරාබි ලෝකයේ දිළිඳුම ජාතිය වන යේමනයට එරෙහිව රියාද් මගින් ගෙනයන ආසන්න ජන සමූලඝාතක යුද්ධයට එකට එක කිරීමක් ලෙස යේමනයේ හවුදි කැරලිකරුවන් විසින් සවුදි පහසුකම් වලට එල්ල කල ඩ්‍රෝන් ප්‍රහාර සඳහා ද ටෙහෙරානයට චෝදනා එල්ල වී ඇත.

ඇත්ත වසයෙන්, 2015 දී ට්‍රම්ප් පාලනාධිකාරිය විසින් ඉරානය සමග පැවැති න්‍යෂ්ටික ගිවිසුම ඉරා දැමීම සහ යුද තත්වයකට සමාන රුදුරු ආර්ථික සම්බාධක පැනවීම යුක්ති සහගත කිරීමට භාවිතා කෙරුනු ඉරානය විසින් න්‍යෂ්ටික අවි හඹා යතැයි යන පදනම් විරහිත එජ චෝදනාව තවමත් පවතී.

නිමක් නැති ප්‍රකෝපකරන වලින් හමුදාමය ප්‍රතිචාරයක් වෙතට ඉරානය පොලඹවා ගැනීමට අපොහොසත් වනු ලදුව, වොෂින්ටනය තම සිරියාවට එරෙහි යුද්ධය ඇවිලවීමේ නව පෙරමුනක් සූදානම් කරන බවට පෙනෙන්නට තිබේ.

චුදිත රසායනික අවි භාවිතයට එකට එක කිරීමක් ලෙස අඟහරුවාදා එජ රාජ්‍ය දෙපාර්තමේන්තුව කල තර්ජනය තුල, "තමා විසින් ම සිදු කරන රසායනික අවි ප්‍රහාරයන්ගේ වගකීම අනුන්ට පැවරීමේ ව්‍යාජ ප්‍රබන්ධයන් නිර්මානය කිරීම සඳහා අසාද් ආන්ඩුව ගෙනයන බොරු ප්‍රචාරය" ට එරෙහි අනතුරු ඇඟවීම් ද ඇතුලත් විය.

පෙනෙන පරිදි මෙම ඡේදය ඇතුලත් කිරීමට බොහෝ කොටම හේතු වූයේ රසායනික අවි තහනම් කිරීම සඳහා වන සංවිධානයේ ප්‍රමුඛ පෙලේ පරීක්ෂකයකු විසින් සූදානම් කෙරුනු ලියවිල්ලක් කාන්දු වීමයි. 2018 අප්‍රේල් මස එල්ල කල, අවසන් එජ, බ්‍රිතාන්‍යය සහ ප්‍රන්ස මිසයිල ප්‍රහාරය සඳහා කඩතුරාවක් ලෙස යොදා ගැනුනු, ඩමස්කස් ආසන්න ඩෝමා නගරයේ සිදු වුනායයි පැවසෙන රසායනික අවි ප්‍රහාරය පිලිබඳ නිල කතාන්දරය ඉහත ලියවිල්ලෙන් කීතු විය.

49 දෙනෙකුට මරු කැඳවමින් නිවාස සංකීර්නයක වහල මතට සිරියානු ආන්ඩුවේ ගුවන් යානයක් මගින් හෙලනු ලැබුවායැයි පැවසෙන ගෑස් සිලින්ඩර පිලිබඳව මෙම වාර්තාව විශ්ලේෂනය කලේය.

"සිලින්ඩරවල දිග පලල, ස්වභාවය සහ පෙනුම මෙන්ම සිද්ධිය සිදු වූ ස්ථානයේ වටාපිටාව සැලකූ විට ගුවන්යානයක සිට සිලින්ඩර හෙලන ලද්දේ නම් අපේක්ෂා කල හැකිව තිබුනු තත්වය සමග සිද්ධිය නොගැලපෙයි" යනුවෙන් වාර්තාව සඳහන් කරයි. එය තවදුරටත් සඳහන් කරන්නේ "මෙම ස්ථානයේ නිරීක්ෂන වලින් සත්‍ය ලෙස දෘෂ්‍යමාන වන එකම පැහැදිලි කිරීම" වන්නේ මෙම සිලින්ඩර අතින් ගෙනවිත් තබා ඇති බවට පරීක්ෂකයින් විසින් සොයා ගත් බවයි. මෙම ස්ථානය අල්කයිඩාවට සම්බන්ධිත මිලීෂියාවල පාලනය යටතේ පැවැති බැවින්, මෙහි අර්ථය වන්නේ, ඩමස්කස් ආන්ඩුව නොව අල්කයිඩාව සිද්ධියට ද, මරන වලටද වග කිව යුතු බව යි.

රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් වක්‍රව සඳහන් කල මෙම වාර්තාව සංගත මාධ්‍ය විසින් සිතාමතාම නොතකා හැරිනි. අනෙකුත් මාධ්‍ය වලට රටාවක් සපයා දෙමින් නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත ඕටගස් මහත්මියගේ චෝදනා දීර්ඝ ලෙස වමාරන නමුත් වොෂින්ටනයේ රසායනික අවි පිලිබඳ චෝදනාවන් කැත ප්‍රබන්ධයන් බව පෙන්නුම් කෙරෙන සාක්ෂි දැඩි ලෙස වාරනය කරයි.

මෙහි කිසිදු අලුත් දෙයක් නැත. 2018 අප්‍රේල් ඩෝමා සිද්ධියෙන් ක්ෂනික ඉක්බිත්තෙහි ප්‍රකට සහ ප්‍රවීන බ්‍රිතාන්‍ය මැද පෙරදිග මාධ්‍යවේදී රොබර්ට් ෆිස්ක් මෙම ස්ථානයට ගොස් වෛද්‍ය සායනයක වෛද්‍යවරු සමග සම්මුඛ සාකච්ඡාවන්හි නිරත විය. ඩෝමා සිද්ධියේදී විෂ වායු ආඝ්‍රානයෙන් ලමුන් මුදා ගැනීම සඳහා ඔවුනට ජලය විදින බව පෙන්නුම් කෙරෙන වීඩියෝ පටයක් පුලුල්ව ප්‍රසිද්ධ කොට තිබුනි. වෛද්‍යවරු ඔහුට පැවසුවේ මෙම දර්ශනය බටහිරින් මුදල් ලබන "වයිට් හෙල්මට්" විසින් රඟදක්වන ලද්දක් බව සහ කිසිවෙකු වායු විෂවීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට සායනය වෙත නොපැමිනි බව ය.

ඩෝමා සිද්ධිය වනාහි, සිරියාවට එරෙහිව එජය විසින් මෙහෙයවන ප්‍රහාර යුක්ති සහගත කිරීමට ගොතන ලද්දක් බව තහවුරු කරන අනෙකුත් සාක්ෂි සමග ෆිස්ක්ගේ වාර්තාව, පෙන්ටගනයේ ප්‍රචාරක හස්තයන් ලෙස ක්‍රියාකරන අනෙකුත් සංගත මාධ්‍යයන් විසින් නොකතා හැරිනි.

ඉඩ්ලිබ් ප්‍රාන්තයේ ඛාන් ෂීක්හෝන් ග්‍රාමයට රසායනික අවි ප්‍රහාරයක් එල්ල වූවා යැයි යන්න පිලිබඳව ප්‍රවීන විමර්ශනාත්මක මාධ්‍යවේදියා විසින්

ඉදිරිපත් කල සාක්ෂි වලට ද 2017 දී මෙවැනිම ප්‍රතිචාරයක් ලැබුනි. මෙම ප්‍රහාරය, අල් කයිඩාවට සම්බන්ධ මිලීෂියා සාමාජිකයින්ගේ රැස්වීමකට එල්ල වූ සම්ප්‍රදායික ප්‍රහාරයක් බව රුසියානු හමුදාව විසින් පෙන්ටගනය සමග මුලදීම පැහැදිලි කර ගනු ලද්දක් විය. එසේ තිබියදීම ට්‍රම්ප් පාලනාධිකාරය සිරියාව තුලට ටොමහෝක් මිසයිල 59 ක් එල්ල කිරීම සඳහා එය කඩතුරාවක් ලෙස යොදා ගත්තේ ය. මෙම ප්‍රහාරයේදී සිවිල් වැසියන් නව දෙනෙකු ඝාතනය වූ බව වාර්තා විය.

සිරියාවට එරෙහි පෙර එල්ල කරන ලද ප්‍රහාර දෙකටම සහාය දැක් වූ ඩිමොක්‍රටික් පක්ෂය නව ප්‍රහාරයට අවිවාදිතව පිටුබලය දෙනු ඇත. රාජ්‍ය දෙපාර්තමේන්තුවේ තර්ජනයට පෙරාතුව, කොන්ග්‍රස් සහ සෙනේට් සභාවන් නියෝජනය කරන ඩිමොක්‍රැටිකයන් 400 ක් විසින් අත්සන් කරන ලද ලිපියක් ට්‍රම්ප්ට භාර දුන්හ. "සිරියාවට සම්බන්ධ ක්‍රියාවන්හි දී ඉරානයට සහ රුසියාවට එරෙහි පීඩනය තීව්‍ර කරන" ලෙස බල කෙරුනු එම ලිපිය හරහා ඔවුහු ට්‍රම්ප් පාලනාධිකාරිය සමග එකට පෙල ගැසුනාහ.

ඉරානයේ "නිල අවසානයක්" සඳහන් කෙරුනු ට්‍රම්ප්ගේ මහා විනාශය පිලිබඳ ට්වීට් තර්ජනය ගැන ඩිමොක්‍රටික පක්ෂය කුමන හෝ කුකුසක් දැක්වුව ද, තන්ත්‍ර මාරුව සඳහා නීති විරෝධී යුද්ධය දිගටම කරගෙන යාමේදී න්‍යෂ්ටික බලවතෙකු වන රුසියාවට සහ සිරියාවට එරෙහිව එජ හමුදාව යොදවන පිලිවෙතක් එය ප්‍රවර්ධනය කරමින් සිටී.

ව්‍යාජ-වම්මු ද මෙසේම වෙති. ඇමරිකාවේ ඩිමොක්‍රටික් සමාජවාදීන්ගේ සිට මෑතකදී විසුරුවා හරින ලද ජාත්‍යන්තර සමාජවාදී සංවිධානයේ මොව්හු ඩිමොක්‍රටික් පක්ෂය සහ එජ හමුදාව සහ බුද්ධි අංශ සමග එක්ව වැඩ කලහ. "මානව අයිතීන්" සඳහා සහ යම් වර්ගයක "ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක" ආකාරයෙන් වන තන්ත්‍ර මාරුවක් සඳහා සීඅයිඒ යුද්ධය විකිනීමට ආයාචනා කරන ඔවුහු මධ්‍යම පන්තියේ වරප්‍රසාදිත කොටස් අතරින් යුද්ධය සඳහා, පෙනෙන හැටියට ලිබරල් ඡන්දදායකත්වයක් නිර්මානය කර ගැනීමට මාන බලති.

ඔවුන්ගේ දේශපාලනය වනාහි පිරිහෙමින් පවතින තම ගෝලීය ආධිපත්‍යය හමුදා මාර්ගයෙන් ජය ගැනීමට එජ අධිරාජ්‍යවාදය යෙදී සිටින රුදුරු ධාවනයේ "වාම" ප්‍රකාශනයයි. විශේෂයෙන් ම, මෙය ලබාගෙන ඇති රූපාකාරය වන්නේ තම ගෝලීය ප්‍රතිමල්ලවයා වන චීනයට අවශ්‍ය කෙරෙන සම්පත් මත තම පාලනය පිහිටුවා ගනිමින්, ඉරානයේ සිට වෙනිසියුලාව දක්වා ලොව තෙල් නිධි මත තම නිර්බාධිත ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ වෑයමයි.

ඉරානයට එරෙහිව යුද්ධය වැඩි දියුනු කිරීම සමග සිරියාවට එරෙහි තර්ජන තුන්වන ලෝක යුද්ධයක අනතුර මතු කරයි. ඒ කෙසේ වෙතත්, මෙම අනතුරට මග පෑදූ එජ යේ සහ ලෝක ධනවාදයේ අර්බුදය විසින් ම එහි විරුද්ධ පැත්ත වන වැඩෙන පන්ති අරගලයද සමාජවාදී විප්ලවය සඳහා වෛෂයික කොන්දේසිවල මුහුකුරා යාමද නිර්මානය කරයි. වඩාත්ම හදිසි කර්තව්‍යය වන්නේ යුද්ධයටත් එහි මූලාශ්‍රය වන ධනපති ක්‍රමයටත් එරෙහිව කම්කරු පන්තියේ මහජන දේශපාලනික ව්‍යාපාරයක් ගොඩ නැගීමය.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org